**බිබිල ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 ජුලි 29 වැනි දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 10 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 20 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

**1.2 මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බිබිල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.15,451,860 ක් වූ දේශීය ණය අරමුදලේ ණය ශේෂය, ගිණුමෙහි රු.4,237,282 ක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ රු.13,921,746 ක් ගිණුම් ගතකර නොතිබූ අතර ගෙවිය යුතු සහන පොලී රු.1,390,983 ක්,ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අගය තක්සේරු කර ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.1,395,464 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.361,088 ක වත්කම් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,871,558ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,749,405 ක් විය.

### 2.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව තථ්‍ය වියදම හා ඇස්තමේන්තුගතවැය ශීර්ෂයන් සියයට 40 සිට සියයට 272 දක්වා විචලනයක් පැවති හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණ බව තහවුරු නොවේ.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හාබදු | 3,073 | 1,371 | 1,702 |
| (ii) | බදු කුලී | 2,428 | 2,158 | 270 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 466 | 485 | - |
| (iv) | වෙනත්ආදායම් | 1,242 | 1,188 | 54 |

**2.3.2 වරිපනම් හා බදු**

----------------

වරිපනම් ඒකක 3,603 කින් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.3,853,441 ක් වූ හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.පසුගිය වර්ෂයේ හිඟ ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම සියයට 79 ක් වැඩි වී තිබුණි.

**2.3.3 බදු කුලී**

--------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය ප්‍රකාරව 1999 වර්ෂයෙන් පසු කඩ කාමර කුලී තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර අංක 01,02 හා 04 යන මාළු කඩවලින් 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අයවිය යුතු රු.966,679 ක හිඟ මුදල අයකර නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

----------------

(අ) අතුරු ව්‍යවස්ථාවන් සම්මත කර ගෙන ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අයකිරීම් අනුමත කර ඇති සභා බල ප්‍රදේශයේ හෝටල්/ලැගුම්හල් දෙකකින් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට 1 නොඉක්මවන ගාස්තුවක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 **නව බස් නැවතුම්පල කඩ කාමර බදු දීම**

--------------------------------------

නාගරික සංවර්ධන අධිකාරියේ ඌව පළාත් අධ්‍යක්ෂකගේ 2009 මැයි 05 දිනැති අංක 25/7/28 දරන ලිපිය ප්‍රකාරව 2009 වර්ෂයේ සිට බදු දෙන ලද නව බස් නැවතුම්පල් කඩකාමර 37 මාසික කුලී මුදල් අයකර ගැනීමට සභාවට බලය පවරා තිබුණි.එහෙත් 2012 සැප්තැම්බර් මස 27 දින දින සභා තීරණ පදනම් කර ගනිමින් 2009 ජුලි සිට 2011 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු.2,268,500ක හිඟ කඩ කාමර කුලිය ගිණුම් වලින් කපා හැරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.4** අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.16,287ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.5** **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-------------------------------

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය සඳහා 2009 වර්ෂයේ දී පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ සහ සභා අරමුදලින් එකතුව රු.1,579,290 ක වියදමක් දරා ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහන් යටතේ අංගනයක් ඉදිකර තිබුන අතර ,2013 අගෝස්තු 02 දින වන විටත් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුනි.

(ආ) බිබිල නගරයේ බැහැර කරන කුණු කසල අවිධිමත් ආකාරයට බිබිල මඩකලපුව ප්‍රධාන මාර්ගය යාබද පිහිටි පුවක් පැලය රක්ෂිතයට මුදා හැර තිබුණි.මේ ආකාරයට කසල බැහැර කිරීම තුලින් අවට පරිසරය පුරා පොලිතීන් වැනි ද්‍රව්‍ය විසිරී ගොස් තිබුණු අතර,ප්‍රදේශය මැස්සන්ගෙන් පිරී පැවතුණි.

**03.** **පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය